# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 90 යි    තැපැල් ගාස්තුව: ශත 50 යි.

# 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනාථ දරු විශ්‍රාම වැටුප් පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 10/07 (II)

රජයේ නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනාථ දරු විශ්‍රාම වැටුප් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මින් මතු මේ පනතෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

රජයේ නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂයන් සහ අනාථ දරුවන් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම භාරව සිටිය යුතු බව.

2. (1) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට අයිතිවාසිකම් ඇති රජයේ නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (මෙහි මින් මතු "විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවිය යුතු ය.

(2) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම භාරව සිටිය යුතු ය.

[illegible]

වැටුප වලින් කරනු ලබන අඩු කිරීම.

3. (1) නියමිත දිනයේ සිට සහ ඉන් පසුව, සෑම දායිකාවකගේ ම පූර්ණ වැටුපෙන්, අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන යම් ප්‍රතිශතයක් අනුව, මාසික අඩු කිරීමක් කරනු ලැබිය යුතු අතර, ඇයට ඒ මාසයේ දී වැටුප වශයෙන් පූර්ණ වැටුපට අඩු මුදලක් ලැබුණත්, කිසිම මුදලක් වැටුප් වශයෙන් නො ලැබුණත්, ඒ අඩු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් කළ යුතු අතර, එය ඔහු විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(3) දායිකාවකගේ වැටුපෙන් මෙහි (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම කරනු නොලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ එක් එක් මාසය සඳහා ඒ දායිකාවගේ වැටුපෙන් අඩු කිරීමට නියම කර ඇති මුදල, ඇගේ වැටුප ඇයට ලැබුණ දින සිට දින තිහක් ඇතුළත, ඇය විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයා වෙත ගෙවීම හෝ දායිකාවට වැටුපක් නොමැතිව නිවාඩු

(4) මෙහි (3) වන උපවගන්තිය යටතේ දායිකාවක විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවිය යුතු සෑම මුදලක් ම, ඇගෙන්, රජයට අය විය යුතු ණයක් ලෙස අය විය යුතු අතර, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වී තිබුණ ද, එම වර්ෂයකට සියයට හතරක් වූ වැල් පොලියක් ද සමග අය කරගනු ලැබිය යුතු ය.

(5) මෙහි (4) වන උපවගන්තියේ සඳහන් පරිදි රජය වෙත යම් දායිකාවකගෙන් අය විය යුතු එවැනි යම් ණයක් රජය විසින් ඒ දායිකාව වෙත ගෙවනු ලැබිය යුතු යම් මුදලකින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් අඩු කරගත යුතු ය.

(6) සෑම නිලධාරිනියකම විසින් නියමිත දින සිට මාස හයක් ඇතුළත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කළ යුතු ය. එසේ දායිකාවක වීමට තීරණය කිරීමට ඇයට හැකිව තිබුණ කාලසීමාව ඉකුත් වීමට පෙර ඒ නිලධාරිනිය මියගිය අවස්ථාවක, ඒ මරණයෙන් පසු ඇගේ ස්වාමිපුරුෂයා හෝ ස්වාමිපුරුෂයා සහ දරුවකු හෝ ස්වාමිපුරුෂයා සහ දරුවන් ජීවත් වන්නේ නම්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට ඇය තීරණය කොට තිබුණ ලෙස සලකනු ලැබිය යුතු ය.

අඩු කිරීම කරනු ලැබිය යුතු කාල සීමාව.

4. දායිකාවක රජයේ සේවයේ නිරතව සිටින තාක් කල් ඇගේ වැටුපෙන් 3 වන වගන්තියේ සඳහන් අඩු කිරීම කරනු ලැබිය යුතු අතර, ඇය රජයේ සේවයෙන් ඉවත් වූ දින සිට, ඒ අඩු කිරීම අවසාන විය යුතු ය.

දායිකාවක විසින්, එසේ තමා දායිකා වකවීමේ දින සිට මාස තුනක් ඇතුළත විස්තර සැපයිය යුතු බව.

5. සෑම දායිකාවකම විසින් ඇය දායිකාවක වූ දිනය, ඇගේ සම්පූර්ණ නම සහ ඇගේ උපන් දිනය සහ ඇය විවාහක නම්, ඇගේ විවාහ දිනය, ඇගේ ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නම, ඇයට දරුවකු හෝ දරුවන් සිටිත් නම්, ඔවුන්ගේ සම්පූර්ණ නම් සහ ඔවුන් ගේ ඒ ඒ උපන් දින දැක්වෙන ප්‍රකාශනයක් එසේ තමා දායිකාවක වීමේ දින සිට මාස තුනක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ස්වාමිපුරුෂයා ගේ මරණය ගැන හෝ ඔහුගේ දික්කසාදවීම ගැන හෝ දරුවාගේ මරණය ගැන සහ ගැහැණු දරුවකුගේ විවාහය නිවේදනය කළ යුතු බව.

6. දායිකාවකගේ ස්වාමිපුරුෂයා මියගිය හෝ දායිකාවක ස්වාමිපුරුෂයාගෙන් දික්කසාද වූ හෝ දායිකාවකගේ දරුවකු මිය ගිය හෝ ගැහැණු දරුවකු විවාහ වූ හෝ අවස්ථාවක, ඒ දායිකාව විසින් සහ මියගිය එවැනි සෑම දරුවකුගේම හෝ විවාහ වූ එවැනි සෑම ගැහැණු දරුවකුගේම භාරකරුවා විසින් ඉන් මාස තුනක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි, ඒ මරණය, දික්කසාදය හෝ විවාහය ගැන අධ්‍යක්ෂවරයා වෙත නිවේදනය කළ යුතු ය.

දරුවකුගේ උපත ගැන හෝ දරුවකු දරුකමට හදා ගැනීම ගැන දායිකාවක විසින් නිවේදනය කළ යුතු බව.

7. සෑම දායිකාවකම විසින්, 5 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශනයේ දිනයෙන් පසුව, තමාට උපන් හෝ තමා විසින් නීත්‍යනුකූලව දරුකමට හදා ගනු ලබන එක් එක් දරුවාගේ උපන් දිනය, අවස්ථාවෝචිත පරිදි, ඒ උපත සිදු වූ දින සිට හෝ දරුකමට හදා ගැනීමේ දින සිට මාස තුනක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත නිවේදනය කළ යුතු ය.

*දායිකාවක විසින් අතිරේක ප්‍රකාශනයක් කළ යුතු බව සහ එහි දැක්වෙන කරුණුවලට සාධක ද එයි අඩංගු විය යුතු බව.*

8. යම් දායිකාවක හෝ භාරකරුවකු විසින් 6 වන වගන්තිය යටතේ, සපයන ලද හෝ 0 වන වගන්තිය හෝ 7 වන වගන්තිය යටතේ කරන ලද යම් තොරතුරක් වැරදි යයි හෝ අසම්පූර්ණ යයි අධ්‍යක්ෂවරයාට පෙනී ගියහොත්, අධ්‍යක්ෂවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත, ඒ ප්‍රකාශයේ හෝ නිවේදනයේ අඩංගු සියලු විස්තර පිළිබඳව ප්‍රමාණවත් සාධක ද සහිතව, නිවැරදි හෝ සම්පූර්ණ තොරතුරු දැක්වෙන වැඩිදුර ප්‍රකාශනයක් කරන ලෙස ඒ දායිකාවට හෝ භාරකරුට නියම කළ හැකි අතර, එවැනි සෑම දැන්වීමකම අඩංගු නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ දායිකාවගේ හෝ භාරකරුවාගේ කාර්යය විය යුතු ය.

*විශ්‍රාම වැටුපට අයිතිවාසිකම ලැබිය යුත්තේ කවරකු ද යන වග.*

9. මේ පනත යටතේ කරනු ලබන අඩුකිරීම්වලට යටත් නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනාථ දරුවන්ට, මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම ලැබිය යුතු ය.

*දික්කසාද වූ විට දායිකාවක වැන්දඹුවක වශයෙන් සලකනු ලැබිය යුතු බව.*

10. දායිකාවකගේ විවාහය දික්කසාදයක් මගින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, මේ පනතේ කාර්ය සඳහා, ඇය වැන්දඹුවක ලෙස සලකනු ලැබිය යුතු ය.

*දායිකාවක විවාහයෙන් එක් වර්ෂයක් ඇතුළත මිය යාම.*

11. යම් දායිකාවක ඇගේ විවාහ දිනයෙන් එක් වර්ෂයක් ඇතුළත මියගිය අවස්ථාවක, ඒ විවාහයෙන් නීත්‍යානුකූල දරුවකු සිටි නම් මිස, ඇගේ වැන්දඹු පුරුෂයාට මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම නොලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථානුගත කරුණු අනුව, ඒ වැන්දඹු පුරුෂයාට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම සාධාරණ යයි සහ යුක්ති සහගත යයි අධ්‍යක්ෂවරයාට පෙනී යන්නේ නම්, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතුව, අධ්‍යක්ෂවරයා විසින් ඒ වැන්දඹු පුරුෂයාට එසේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*අනාථ දරුවන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් අවසාන විය යුත්තේ කවර දිනක ද යන බව.*

12. මේ පනත යටතේ අනාථ දරුවකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ඒ අනාථ දරුවා පුරුෂයකු වන විට, ඔහුගේ වයස අවුරුදු විසි එක සම්පූර්ණ වූ විට, අවසාන විය යුතු අතර, ඒ අනාථ දරුවා ස්ත්‍රියක වන විට, ඇයගේ වයස අවුරුදු විසි එක සම්පූර්ණ වීම හෝ ඇයගේ විවාහය යන දෙකින් කවර දෙයක් කලින් සිදු වුවද, එවිට අවසාන විය යුතු ය.

*සදාකාලික වශයෙන් අබලතාවයට පත්වූ අනාථ දරුවන්ට ජීවිත විශ්‍රාම වැටුපක් ගෙවීම.*

13. යම් දායිකාවකගේ අනාථ දරුවකුට ජීවිකා වෘත්තිය කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත් කරන යම් ශාරීරික හෝ මානසික දුබලතාවයකින් ඒ අනාථ දරුවා පෙළෙන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන වෛද්‍ය නිලධරයන් තුන් දෙනකුගෙන් සමන්විත වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, මේ පනතේ කුමක් සඳහන් වී තිබුණ ද, ඒ අනාථ දරුවාට තම ජීවිත කාලය තුළ දී මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුප ගණන් බැලීම.

14. (1) යම් දායිකාවක් නියමිත දිනයේ දී හෝ ඉන් පසුව මියගිය අවස්ථාවක, ඇගේ වැන්දඹු පුරුෂයාට හෝ අනත් දරුවාට මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප පහත දැක්වෙන විධිවිධාන වලට අනුකූලව තීරණය කරනු ලැබිය යුතු ය :—

(අ) ඒ දායිකාව රජයේ සේවයේ නිරතව සිටිය දී මියගිය හෝ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම යාමෙන් පසු හෝ ආයතන සංග්‍රහයේ දක්වා ඇති හේතුන් නොවන යම් හේතුවක් මත රජයේ සේවයෙන් විශ්‍රාම යැවීමෙන් පසු මියගිය අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප් ප්‍රමාණය—

(i) අවස්ථාවෝචිත පරිදි, ඇගේ මරණය හෝ විශ්‍රාම යාම සිදුවුන වේලාවේ දී, ඇගේ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාලසීමාව අවුරුදු විසිපහට අඩු නම්, අවුරුදු විසිපහක් වූ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාල සීමාව, හෝ ඇය මිය නොගියේ නම් හෝ විශ්‍රාම නොගියේ නම්, අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමේ දී ඇය විසින් සම්පූර්ණ කළ හැකිව තිබුණ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාලසීමාව යන දෙකින් වඩා කෙටි කාලය සඳහා, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන ප්‍රමාණයක් ;

(ii) අවස්ථාවෝචිත පරිදි, ඇගේ මරණය හෝ විශ්‍රාම යාම සිදුවුන වේලාවේ දී, ඇගේ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාලසීමාව අවුරුදු විසිපහට අඩු නොවේ නම්, ඒ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාලය සඳහා, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන ප්‍රමාණයක්

විය යුතු ය :

එසේ වුව ද, ඒ තැනැත්තියගේ මරණය හෝ විශ්‍රාම යාම සිදුවුනු අවස්ථාවේ දී, ඇය විශේෂ තනතුරක් හෝ ධුරයක් දැරුවේ නම්, ඒ විශ්‍රාම වැටුපේ ප්‍රමාණය ඇගේ අවසාන වැටුපෙන් සියයට පනහකට නොඅඩු විය යුතු ය ;

(ආ) ඒ නිලධාරිනිය අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමේ හේතුව මත හෝ ආයතන සංග්‍රහයේ දක්වන ලද යම් හේතුවක් මත, රජයේ සේවයෙන් විශ්‍රාම යාමෙන් පසුව හෝ විශ්‍රාම ගැන්වීමෙන් පසුව මිය ගිය අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප, ඇගේ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවා කාල සීමාව සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන ප්‍රමාණයක් විය යුතු ය ;

(ඇ) ඒ නිලධාරිනිය ආණ්ඩුවේ අනුමතිය ඇතිව, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමෙන් පසුව, ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සේවයේ යෙදී සිටිය දී හෝ තදනන්තරව ඇය මාරු කරන ලද වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ යෙදී සිටිය දී, මියගිය අවස්ථාවක හෝ ඇය ආණ්ඩුවේ සේවයෙන් ස්ථිර වශයෙන් පත්

කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් හෝ පාදනාත්තරම
ඇය මාරු කරනු ලද, වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලය
කින් විශ්‍රාම වැටුප් ලැබිය යුතු තත්ත්වයන් විශ්‍රාම
යාමෙන් හෝ විශ්‍රාම ගැන්වීමෙන් පසුව මියගිය අවස්ථා
වක, ඒ විශ්‍රාම වැටුපේ ප්‍රමාණය, විශ්‍රාම වැටුප් ලැබිය යුතු
සේවා කාලසීමාව සඳහා, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ
ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන ප්‍රමාණයක් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි—

"අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස" යන්න, නිලධාරිනියක සම්
බන්ධයෙන් යෙදෙන විට, ඉන් ඒ නිලධාරිනිය රජයේ
සේවයෙන් විශ්‍රාම ගැනීම අනිවාර්ය වන්නේ යම් වයසක
දී ද, ඒ වයස අදහස් වේ ;

"අවසාන වැටුප" යන්නෙන්

(අ) රජයේ සේවයේ යෙදී සිටිය දී මියගිය දූයිකාවක සම්
බන්ධයෙන් යෙදෙන විට, ඉන් ඒ දූයිකාවගේ මරණය සිදුවූ
වේලාවේ දී ඇය ලැබූ වැටුප අදහස් වේ ;
නමද,

(ආ) රජයේ සේවයෙන් ඉවත්වීමෙන් පසුව මියගිය දූයිකා
වක සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් අවස්ථාවෝ
චිත පරිදි, ඒ දූයිකාව රජයේ සේවයෙන් විශ්‍රාම ගිය
වේලාවේ දී හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර
පත්වීමක් සඳහා රජයේ සේවයෙන් ඇය මුදා හැරි
වේලාවේ දී හෝ ඇය ලැබූ වැටුප අදහස් වේ ;

"විශ්‍රාම වැටුප් ලැබිය යුතු තත්ත්වයන් " යන්නෙන්, වයස,
අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ධුරය අහෝසි කිරීම හෝ යම්
නෑනැත්තකු විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම් විශ්‍රාම
වැටුප් ව්‍යවස්ථා යටතේ ලබන වෙනත් යම් හේතුවක්
අදහස් වේ ;

"විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප"
යන්නට, ඒ ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු යම් දේශ
ගුණික, ප්‍රසාද දීමනාවක් සහ වෙනත් යම් විශ්‍රාම වැටුප්
ලැබිය යුතු දීමනාවක් ඇතුළත් වන අතර, ඒ ව්‍යවස්ථා
යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට කරන ලද වෙනත් එක
තුවක් හෝ ඒ විශ්‍රාම වැටුපෙන් කරන ලද යම් අඩු කිරීමක්
හෝ ඊට ඇතුළත් නොවේ ;

"විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවය" යන්නෙන්, නිලධාරිනිය
විසින් අන්න වයසෙන්ම ඉටු කරනු ලැබූ සහ විශ්‍රාම වැටුප්
ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සඳහා සේවයක් වශ
යෙන් ගණන් ගනු ලබන යම් සේවයක් අදහස් වන අතර,
... ව්‍යවස්ථාවලින් සලස්වනු ලැබ තිබෙන

"විශේෂ තනතුර හෝ ධුරය" යන්නෙන් —

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයාගේ තනතුර හෝ ධුරය සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල "ක" උපලේඛනයේ සඳහන් වෙනත් යම් තනතුරක් හෝ ධුරයක්; සහ

(ආ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු වන තැනැත්තකු විසින් දරනු ලබන යම් තනතුරක් හෝ ධුරයක්

අදහස් වේ;

"ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන්නෙහි, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48අ වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය;

තවද

"මාරු කරන ලද" යන්නෙහි විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48අ වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවයට අදාළ විශේෂ විධිවිධාන.

15. (1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ වැටුප්වලින් ද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායිකාවක වන යම් නිලධාරිනියක, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ පට හැටිව කුමක් සඳහන් වී තිබුණ ද, නියමිත දින හෝ ඉන් පසුව, මේ පනත යටතේ දායිකාවක වන අවස්ථාවක, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ ඇය ඒ අරමුදලට දායක වූ සම්පූර්ණ කාලසීමාව සඳහා ඒ නිලධාරිනියගේ සම්පූර්ණ වැටුප්වලින් සියයට හතරකට සමාන මුදලක් ඒ ආඥාපනත යටතේ ඒ නිලධාරිනියට ගෙවිය යුතු මුදල්වලින් අඩු කර ගනු ලැබිය යුතු ය. අඩු කර ගනු ලැබූ මුදල ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, ඒ මුදල අඩු කර ගනු ලැබුවේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ නිලධාරිනිය විසින් මේ පනත යටතේ දායක මුදල් ගෙවන ලද කාලසීමාවක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ දායිකාවක සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප 14 වන වගන්තිය යටතේ වන අවස්ථාවක, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඒ නිලධාරිනියට ගෙවිය යුතු විශ්‍රාම වැටුප පදනම් කරගෙන ගණන් බලනු ලබන්නා වූ සහ ඒ තැනැත්තියගේ විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවයට, මේ පනත යටතේ දායක මුදල් නොගෙවූ යම් සේවයක් ඇතුළත් වන්නා වූ අවස්ථාවක, මේ පනත යටතේ දායක මුදල් නොගෙවන ලද සම්පූර්ණ කාලසීමාව සඳහා ඒ දායිකාවගේ මූල වැටුපෙන් සියයට හතරකට සමාන මුදල් ප්‍රමාණයක් සහ ඒ මුදල් ප්‍රමාණය මෙතුවෙන් වර්ෂයකට සියයට හතරක පොලියක් ද ඒ දායිකාවට හෝ ඒ දායිකාව සම්බන්ධයෙන් රජයෙන් අය විය යුතු යම් මුදලකින්, ඒ දායිකාවගේ කැමැත්ත ඇතිව, අඩු කර ගැනීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය හැකි ය:

එසේ වුව ද, ඒ දායිකාව 1951 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වී, 1970 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා, පාසල් ගුරු විශ්‍රාම වැටුප් පනත

යටතේ පිහිටුවනු ලද පාසල් ගුරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායිකාවක වූ ගුරුවරියක වන අවස්ථාවක, මේ පනත යටතේ දායක මුදල් නො ගෙවන ලද සම්පූර්ණ කාලසීමාව සඳහා, ඒ දායිකාවගේ මුළු වැටුප් සියයට දෙකකට සමාන මුදල් ප්‍රමාණයක් සහ ඒ මුදල් ප්‍රමාණය වෙනුවෙන් වර්ෂයකට සියයට හතරක පොලියක් ද ඇයට රජයෙන් අයවිය යුතු යම් මුදලකින් ඒ දායිකාවගේ කැමැත්ත ඇතිව අඩු කර ගැනීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය හැකි ය.

(3) දායිකාවක විසින් දායක මුදල් නොගෙවන ලද මුළු විශ්‍රාම වැටුප් ගෙවිය යුතු සේවය සඳහා හෝ ඉන් කොටසක් සඳහා හෝ (2) වන උපවගන්තිය යටතේ අඩුකිරීමක් කළ නොහැකි අවස්ථාවක, ඒ ඒ දායිකාව විසින් හෝ ඇය ජීවත්ව නොසිටින අවස්ථාවක, ඒ දායිකාව සම්බන්ධයෙන් මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම ලබන ඒ දායිකාවගේ වැන්දඹු පුරුෂයා විසින් හෝ අනාථ දරුවා විසින් (2) වන උපවගන්තිය ප්‍රකාර අඩු කළ යුතුව තිබුණ මුදලට සමාන මුදලක්, ඔහු හෝ ඇය කැමති නම්, අධ්‍යක්ෂවරයා වෙත ගෙවිය හැකි ය. ඒ ගෙවීම කරනු නොලැබුවහොත්, ඒ දායිකාව සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවනු ලැබිය යුතු විශ්‍රාම වැටුප, ගෙවීම කරනු නොලැබූ එක් එක් සම්පූර්ණ මාසය සම්බන්ධයෙන් 1/600 කින් අවකරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි " විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවය " යන්නෙහි 14 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

16. යම් දායිකාවකට හෝ ඇගේ නීත්‍යනුකූල නියෝජිතයන්ට හෝ උරුමක්කාරයන්ට මේ පනත යටතේ ගෙවිය යුතු සියලුම විශ්‍රාම වැටුප් සහ මේ පනත යටතේ ආපසු ගෙවීමට ඇති සියලු මුදල් ප්‍රමාණ සහ ගෙවීමට ඇති සියලු පොලී ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ඒවා ඒ ඒකාබද්ධ අරමුදලේ වැය බරක් බවට මෙයින් පත් කරනු ලැබේ.

17. (1) වැන්දඹුවක වූ යම් දායිකාවක් සහ අවිවාහක හැකැත් තියක ලෙස මේ පනත යටතේ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම ඇති දරුවකු හෝ දරුවන් ජීවත්ව සිටිය දී මියගිය අවස්ථාවක හෝ යම් දායිකාවකගේ වැන්දඹු පුරුෂයෙක් ඒ දායිකාව සමඟ වූ ඔහුගේ විවාහයෙන් ලැබුණු සහ මේ පනත යටතේ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම් ඇති දරුවකු හෝ දරුවන් ජීවත්ව සිටිය දී මියගිය අවස්ථාවක, ඒ දරුවාගේ හෝ දරුවන්ගේ විශ්‍රාම වැටුප, ඒ වැන්දඹු පුරුෂයාට ලැබිය යුතුව තිබූ හෝ ඔහු ලබමින් සිටි හෝ මුදල් ප්‍රමාණය විය යුතු අතර එය දරුවන් අතරේ සමානව බෙදිය යුතු ය.

(2) විවාහක දායිකාවක විසින් තමා දායිකාවක්ව සිටිය දී, ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ හෝ දරුකමට හදාගැනීමට අදාළ වෙනත් යම් නීතියක හෝ විධිවිධාන යටතේ දරුකමට හදාගනු ලැබූ දරුවකු (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දායිකාවගේ දරුවකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දායිකාවගේම දරුවකුට විශ්‍රාම වැටුපට අයිතිවාසිකම් ලැබෙන ආකාරයෙන්ම, ඒ දරුවාට, ඒ දායිකාවගේම දරුවකුට ලැබීමට සිදු වන පරිදි ලැබෙන මැටම ලැබීමට ද අයිතිවාසිකම ලැබිය

(3) විවාහක දායිකාවක විසින් තමා දායිකාවකව සිටියදී ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතෙහි හෝ දරුකමට හදා ගැනීමට අදාළ වෙනත් යම් නීතියක හෝ විධිවිධාන යටතේ දරුකමට හදාගනු ලැබූ දරුවකුට, දරුවා දරුකමට හදාගැනීම සඳහා ඒ දායිකාව තුළ නිර්ව්‍යාජ අභිලාෂයක් නොමැති වූ බවත් දරුකමට හදාගැනීම හුදෙක් වාසිය තකාම කරනු ලැබ තිබෙන්නක් බවත් විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු තිබේ නම් මිස, මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම ලැබිය යුතු ය:

එසේ වුවද, ඒ දරුවාට තම ජීවනෝපායය සඳහා ස්වාධීන ප්‍රභවයක් නොමැති නම් සහ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම සියලු අවස්ථානුගත කරුණු අනුව සාධාරණ යයි සහ යුක්තිසහගත යයි අධ්‍යක්ෂවරයා සලකන්නේ නම්, එවැනි ප්‍රදානයක් කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය දිය හැකි ය.

වැන්දඹු පුරුෂයා විවාහ වූ විටක අදාළ වන විධිවිධාන.

18. යම් දායිකාවකගේ වැන්දඹු පුරුෂයා මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම ලැබීමෙන් පසු කවර හෝ විටක දී නැවත විවාහ වූ අවස්ථාවක, එසේ විවාහ වූ වැන්දඹු පුරුෂයාට විශ්‍රාම වැටුප ලැබීම ඒ විවාහයේ දින සිට අවසාන විය යුතු ය; තවද එවිට වැන්දඹු පුරුෂයාගේ සහ දායිකාවගේ, විශ්‍රාම වැටුපට අයිතිවාසිකම ඇති දරුවන්ට, ඒ වැන්දඹු පුරුෂයා නැවත විවාහ නොවූයේ නම් ඔහුට ලැබිය යුතුව තිබුණු මුදල් ප්‍රමාණයට අයිතිවාසිකම ලැබිය යුතු අතර ඒ මුදල් ප්‍රමාණය දරුවන් අතරේ සමානව බෙදිය යුතු ය.

වැන්දඹු පුරුෂයකු සහ පෙර විවාහයක දරුවන් සම්බන්ධයෙන් වන විධිවිධාන.

19. (1) යම් දායිකාවක වැන්දඹු පුරුෂයකු සහ පෙර විවාහයකින් ලැබුණු දරුවන් ජීවත්ව සිටිය දී මියගිය අවස්ථාවක සහ ඒ දරුවන් මේ පනත යටතේ විශ්‍රාම වැටුප්වලට අයිතිවාසිකම ලබන වයස්වලින් යුක්ත වන අවස්ථාවක, ඔවුන්ගේ මව මිය යාමෙන් පසුව ද ඔවුන්ගේ පියා ජීවත්ව සිටියේ නම්, ඔහුට අයිතිවාසිකම ලැබිය යුතුව තිබුණු විශ්‍රාම වැටුපේ අඩකින් සමානව බෙදන ලද කොටසක් හෝ පංගුවක් ලැබීමට ඒ එක් එක් දරුවා අයිතිවාසිකම ලැබිය යුතු ය. එවැනි කිසිම දරුවකු නොසිටියේ නම් ඒ දායිකාවගේ වැන්දඹු පුරුෂයාට අයිතිවාසිකම ලැබිය යුතුව තිබුණු විශ්‍රාම වැටුපෙන් අඩක් ලැබීමට ඔහුට අයිතිවාසිකම ලැබිය යුතු ය.

(2) යම් දායිකාවක් වැන්දඹු පුරුෂයකු ජීවත්ව සිටිය දී සහ පෙර විවාහයකින් ලැබුණු දරුවන් නොමැතිව හෝ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම අවසාන වූ, පෙර විවාහයකින් ලැබුණු යම් දරුවන් ජීවත්ව සිටිය දී මිය ගිය අවස්ථාවක, ඒ වැන්දඹු පුරුෂයාට ඒ සම්පූර්ණ විශ්‍රාම වැටුපම ලැබීමට අයිතිවාසිකම ලැබිය යුතු ය.

(3) දායිකාව සමග වූ තම විවාහයෙන් ලැබුණු කිසිම දරුවකු නොමැතිව වැන්දඹු පුරුෂයා මිය ගිය අවස්ථාවක, දායිකාවගේ පළමු විවාහයෙන් ලැබුණු සහ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම ඇති දරුවන්ට ඒ දායිකාව ඒ තැනැත්තා පරිත්‍යාගය කරගෙන නොමැති වූ විටක මෙන්, ඒ විශ්‍රාම වැටුප ලැබීමට අයිතිවාසිකම ලැබිය යුතු ය.

(4) දායිකාව සමග වූ තම විවාහයෙන් ලැබුණු දරුවන් ජීවත්ව සිටියදී වැන්දඹු පුරුෂයා මිය ගිය අවස්ථාවක, ඒ දරුවන් ඔවුන්ගේ පියාට අයිතිවාසිකම තිබුණු විශ්‍රාම වැටුපෙන් සමාන කොටස හෝ පංගුව බැගින් ලැබීමට අයිතිවාසිකම ලැබිය යුතු ය.

20. (1) මේ පනත යටතේ දායිකාවක සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප, අවශ්‍යතාවෙන් පිට පරිදි, දායිකාවගේ හෝ ඇගේ වැන්දඹු පුරුෂයාගේ හෝ මරණය සිදු වූ විට ආරම්භ විය යුතු ය. තවද, එය දෛනිකව උපචිත විය යුතු අතර මාසිකව ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් ගෙවීමක් කිරීමට පෙර, ඒ වැන්දඹු පුරුෂයකු හෝ දරුවකු ජීවත්ව සිටින බවට සහ ඒ වැන්දඹු පුරුෂයා හෝ දරුවා විසින් හිමිකම්පාන ලද විශ්‍රාම වැටුපට අයිතිවාසිකම ඇති බවට සාධක ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. | විශ්‍රාම වැටුප ගෙවිය යුතු බව.

(2) මෙහි (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප, වැන්දඹු පුරුෂයා මිය ගිය මාසයේ අවසානය දක්වා ඒ වැන්දඹු පුරුෂයාට ගෙවනු ලැබිය යුතු ය.

21. මේ පනත යටතේ වැන්දඹු පුරුෂයකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ඒ වැන්දඹු පුරුෂයා වෙනුවෙන් සුදුසු සහ නිසි තැනැත්තකුට අධ්‍යක්ෂවරයා විසින් ගෙවිය හැකි ය. ඒ විශ්‍රාම වැටුප එසේ ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප ලබන තැනැත්තා විසින්, වැන්දඹු පුරුෂයාගේ සහ ඔහු මිය ගිය විට විශ්‍රාම වැටුපක් ලැබීමට මේ පනත යටතේ අයිතිවාසිකම ලබන ඔහුගේ දරුවකු හෝ දරුවන් සිටින් නම්, ඔහුගේ හෝ ඔවුන්ගේ නඩත්තුව, පෝෂණය හෝ ප්‍රතිලාභය සඳහා, අධ්‍යක්ෂවරයා විසින් නිරණය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව, එය යෙදවිය යුතු ය. | වැන්දඹු පුරුෂයකුට අය විශ්‍රාම ගෙවීම.

22. මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹු පුරුෂයකු, ඔහු මිය ගිය විට මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම ලබන දරුවකු අතහැර දමා ඇති බව හෝ අතරමං කර ඇති බව හෝ තමාගේ වත්පොහොසත්කම අනුව කළ හැකි තාක් දුරට නඩත්තු කිරීම හෝ ඒ දරුවාට ආධාර කිරීම පැහැර හැර ඇති බවට අධ්‍යක්ෂවරයාට ඒත්තු යන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් අදාළ කරුණු සැලකිල්ලට ගනිමින්, ඒ දරුවාට හෝ ඒ දරුවා වෙනුවෙන් සුදුසු සහ නිසි තැනැත්තකුට, ඒ දරුවාගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ඒ වැන්දඹු පුරුෂයාගේ විශ්‍රාම වැටුපෙන් සුදුසු යයි අධ්‍යක්ෂවරයා සලකන යම් කොටසක් ගෙවිය හැකි ය. තවද, එසේ ගෙවනු ලැබූ වැන්දඹු පුරුෂයකුගේ විශ්‍රාම වැටුපේ යම් කොටසක් සම්බන්ධව වැන්දඹු පුරුෂයාට තවදුරටත් කිසිම හිමිකමක් ඔහුට නොලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ යම් පුරුෂයකුගේ දරුවකු වෙනුවෙන්, ඒ වැන්දඹු පුරුෂයාගේ විශ්‍රාම වැටුපේ යම් කොටසක් තැනැත්තකුට ගෙවන ලද ඒ වැන්දඹු පුරුෂයාගේ විශ්‍රාම වැටුපේ යම් කොටසක්, ඒ දරුවාගේ නඩත්තුව, පෝෂණය හෝ ප්‍රතිලාභය සඳහා, අධ්‍යක්ෂවරයා විසින් නිරණය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව, ඒ තැනැත්තා විසින් යෙදවිය යුතු ය. | දරුවා නඩත්තු නොකළ ...

23. (1) බාලවයස් කාරයකුට මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපක්, ඒ බාලවයස් කාරයාට කෙළින්ම හෝ යම් පදවිගත විශ්‍රාම වැටුපක්, ඒ බාලවයස් කාරයා වෙනුවෙන් විශ්‍රාම වැටුප් ලබාගැනීමට දරන්නකුට හෝ බාලවයස් කාරයා වෙනුවෙන් පත් කරනු ලබන ලැබීමට අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් පත් කරනු ලබන යම් තැනැත්තකුට හෝ අධ්‍යක්ෂවරයා විසින් ගෙවිය හැකි ය. එසේ පත් කරන ලද යම් තැනැත්තකුට විශ්‍රාම වැටුප ගෙවනු

ලැබූ අවුරුදු පාටයත්, බාලවයස්කාරයාගේ නඩත්තුව, පෝෂණය හෝ ප්‍රතිලාභය සඳහා, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන යම් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව, ඒ තැනැත්තා විසින්, විශ්‍රාම වැටුප යෙදවිය යුතු ය.

(2) 21 වන වගන්තිය හෝ 22 වන වගන්තිය හෝ 23 වන වගන්තිය යටතේ යම් වැන්දඹු පුරුෂයකුගේ හෝ යම් දරුවකුගේ නඩත්තුව, පෝෂණය හෝ ප්‍රතිලාභය සඳහා යම් නියමයන් සහ කොන්දේසි තීරණය කිරීමේ දී, ඒ වැන්දඹු පුරුෂයාගේ හෝ ඒ දරුවාගේ සුභසිද්ධිය සහ අවශ්‍යතා අධ්‍යක්ෂවරයා විසින් සැලකිල්ලට ගත යුතු ය.

විශ්‍රාම වැටුප පැවරීම හෝ විශ්‍රාම වැටුපෙන් කිසිවක් අයකර ගැනීම හෝ නොකළ යුතු බව.

24. මේ පනත යටතේ ගෙවනු ලැබිය යුතු කිසිම විශ්‍රාම වැටුපක් පැවරීම හෝ අන්සතු කිරීම හෝ කරනු නොලැබිය යුතු අතර, ඒ අනුව, මේ වගන්තිය කඩ කරමින්, කරන ලද සෑම පැවරීමක් ම හෝ අන්සතු කිරීමක් ම බල රහිත සහ ශූන්‍ය විය යුතුය. ඒ විශ්‍රාම වැටුප ගෙවිය යුත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් අය විය යුතු යම් ණයක් හෝ ගෙවීමක් සම්බන්ධයෙන්, රිට් ආඥාවක් ක්‍රියාවේ යොදවමින් එවැනි යම් විශ්‍රාම වැටුපක් තහනමට ගැනීම හෝ එවැනි විශ්‍රාම වැටුපකින් කිසිවක් අය කර ගැනීම හෝ එවැනි විශ්‍රාම වැටුපක් තහනම් කිරීම හෝ ගැනීම හෝ කරනු නො ලැබිය යුතුය.

දායිකාවක විසින් දායක මුදල් ගෙවනු ලැබීම නතර වීමෙන් පසු විවාහයක් කරගෙන තිබේ නම්, විශ්‍රාම වැටුප ලැබීමට වැන්දඹු පුරුෂයාට අයිතිවාසිකම් නොමැති බව.

25. දායක මුදල් ගෙවනු ලැබීම නතර වීමෙන් පසු විවාහ වූ දායිකාවකගේ යම් වැන්දඹු පුරුෂයකුට සහ ඒ විවාහයෙන් ලැබුණු කිසිම දරුවකුට මේ පනත යටතේ යම් විශ්‍රාම වැටුපකට අයිතිවාසිකම් නොලැබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවය සම්බන්ධයෙන් දායක මුදල් ගෙවීම.

26. (1) මේ පනතෙහි කුමක් සඳහන් වී තිබුණ ද, යෝජනා ක්‍රමය යටතේ දායක මුදල් ගෙවීමට නීරණය කළ සහ තමා දායිකාවක වූ දිනයට පෙරාතුව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගණන් ගත හැකි, විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවයක් කර ඇති නිලධාරිණියක විසින්, ඇගේ මනාපය පරිදි, ඒ ගණන් ගත හැකි සේවය සම්බන්ධයෙන්, ඇගේ වැටුපෙන් සියයට හතරක් වූ දායක මුදලක් සහ සියයට හතර බැගින් වූ පොලියක් ගෙවිය හැකි ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් දායක මුදල සහ පොලිය නිලධාරිණිය විසින්—

(අ) නිලධාරිණිය රජයේ සේවයේ නිරත වී සිටින කාලසීමාව තුළ ඕනෑම වේලාවක දී එකවර ගෙවන මුදලක් වශයෙන්; නැත්නම්

(ආ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම ලැබීමේ දී ඇයට ගෙවනු ලැබිය යුතු පරිවර්තිත විශ්‍රාම වැටුපෙන්; හෝ

(අ) රජයේ සේවයෙන් ඇය විශ්‍රාම ලැබූ මාසයේ ඇගේ වැටුපෙන් ලබා ගනු ලැබූ දායක මුදලේ මාසික අනුප්‍රමාණය අනුව හෝ නිලධාරිනිය හා අධ්‍යක්ෂවරයා එකඟ වන යම් වැඩි අනුප්‍රමාණයක් අනුව හෝ ඇගේ මාසික විශ්‍රාම වැටුපෙන්, අඩු කර ගනු ලබන මාසික කොටස් මුදල්වලින්, හෝ

ගෙවිය හැකි ය.

(3) යම් නිලධාරිනියක් (1) වන උපවගන්තියේ සඳහන් දායක මුදල සහ පොලිය (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ආකාරයට ගෙවනු ලබන අවස්ථාවක, ඇති විධිවිධානවල සඳහන් ආකාරයට ගෙවනු ලබන අවස්ථාවක, ඉතිරි දායක මුදල සහ පොලිය ගෙවා නිම කිරීමට පෙර ඕනෑම වේලාවක දී, තම විශ්‍රාම වැටුපෙන් එම ගෙවීම නතර කිරීමට තමා අදහස් කර ඇති බව ඇය විසින් අධ්‍යක්ෂවරයා වෙත නිවේදනය කළ හැකි අතර, අධ්‍යක්ෂවරයා විසින් එම නිවේදනය ලැබුණු දින සිට ඒ ඉතිරි දායක මුදල අය කර ගැනීම නතර කළ යුතු ය.

ඇය වැන්දඹුවක වී ඇති බව සහ විශ්‍රාම වැටුප් ලැබිය යුතු වයසින් යුක්ත දරුවන් තමාට නැති බව නිලධාරිනිය විසින් අධ්‍යක්ෂවරයා වෙත නිවේදනය කරන ලද විටක ද, දායක මුදල් අය කර ගැනීම නතර විය යුතු ය.

(4) නිලධාරිනියක විසින් (1) වන උපවගන්තියේ සඳහන් දායක මුදල් සහ පොලිය ගෙවනු නොලැබූ අවස්ථාවක හෝ ඇය විසින් ඉන් කොටසක් පමණක් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ දායිකාවගේ වැන්දඹු පුරුෂයා විසින්, අවස්ථාවෝචිත පරිදි, මුළුමනින්ම ඒ දායක මුදල් සහ පොලිය හෝ ගෙවිය යුතුව තිබෙන යම් ඉතිරි මුදලක්, ඒ වැන්දඹු පුරුෂයාගේ මූල්‍ය සම්පත් සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් ගෙවිය හැකි ය.

27. (1) අවිවාහක ස්ත්‍රියක වූ යම් දායිකාවක් අවිවාහකව තමන් වයෙන් ම රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ අන්‍යාකාරයකින් අස් වන අවස්ථාවක මේ පනත යටතේ ඒ දායිකාව විසින්, ගෙවන ලද දායක මුදල්, වර්ෂයකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලී ද සමග, ඇය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(2) අවිවාහක ස්ත්‍රියක වූ යම් දායිකාවක් රජයේ සේවයේ යෙදී සිටියදීම මියගිය අවස්ථාවක, මේ පනත යටතේ ඇය විසින් ගෙවන ලද දායක මුදල් ඇගේ නීත්‍යනුකූල නියෝජිතයන්ට ගෙවනු ලැබිය යුතු ය.

28. විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් නොමැති වැන්දඹු ස්ත්‍රියක වූ යම් දායිකාවක් විශ්‍රාම වැටුප් මත රජයේ සේවයෙන් විශ්‍රාම යන අවස්ථාවක හෝ විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් නොමැති වැන්දඹු ස්ත්‍රියක වූ යම් දායිකාවක් ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් රජයේ සේවයෙන් ඉවත් වන අවස්ථාවක, හෝ නොමැති වැන්දඹු ස්ත්‍රියක වූ විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් නොමැති වැන්දඹු ස්ත්‍රියක වූ

යම් දායිකාවක් රජයේ සේවයේ නිරතව සිටිය දී මිය ගිය අවස්ථා වක, දායිකාවගේ ආපසු ගෙවිය යුතු දායක මුදල් මුළුමනින් ම, ඒ වෙනුවෙන් සියයට දෙකහමාර බැගින් වැල් පොලිය ද සමග, ආපසු ලැබීමට අවස්ථාවෝචිත පරිදි, ඒ දායිකාවට හෝ ඒ දායිකාවගේ නීත්‍යානුකූල නියෝජිතයාට අයිතිවාසිකම ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුපක් නොමැතිව රජයේ සේවයෙන් ඉවත්වන දායිකාවට දායක මුදල් ආපසු ගෙවීම.

29. විවාහක දායිකාවක රජයේ සේවයෙන් ඉවත් වන අවස්ථා වක, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට ඇයට අයිතිවාසිකම නොමැති නම්, පොලියක් නොමැතිව, මේ පනත යටතේ ඇගේ දායක මුදල් මුළුමනින් ම ආපසු ලැබීමට ඇය අයිතිවාසිකම ලැබිය යුතු අතර, ඒ දායක මුදල් ආපසු ගෙවනු ලැබූ විට, ඒ දායිකා වට හෝ ඇය මඟින් හෝ ඇය යටතේ හිමිකම් පාන යම් තැනැත්ත කුට මේ පනත යටතේ ප්‍රතිලාභ කිසිවක් ලැබීමට ඇති අයිතිවාසිකම නතර විය යුතු ය.

මුදල් බද්දෙන් නිදහස් කිරීම.

30. මියගිය දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු හෝ අනාථ දරුවකු මේ පනත යටතේ අයිතිවාසිකම ලබන කිසිම විශ්‍රාම වැටුපක්, 1980 අංක 13 දරන මුදල් බදු පනත යටතේ මුදල් බදු ගෙවීමට යටත් නොවිය යුතු ය.

අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඇතැම් ප්‍රශ්න තීරණය කළ යුතු බව.

31. මේ පනතේ අර්ථානුකූලව යම් තැනැත්තියක් දායිකාවක වේද යන්න පිළිබඳව හෝ දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු වශයෙන් හෝ අනාථ දරුවකු වශයෙන් යම් තැනැත්තකු මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම් ලැබ තිබෙන්නේ ද යන්න පිළිබඳව, හෝ මේ පනත යටතේ වැන්දඹු පුරුෂයකුට හෝ අනාථ දරුවකුට ලැබීමට අයිතිවාසිකම තිබෙන විශ්‍රාම වැටුපේ ප්‍රමාණය පිළිබඳව හෝ යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක, ඒ ප්‍රශ්නය අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කළ යුතු ය.

අර්ථ නිරූපණය.

32. මේ පනතෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"දායිකාව" යන්නෙන්—

(අ) නියමිත දිනයෙහි නිලධාරිනියක වන්නා වූ ද 3(6) වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායිකාවක වීමට තීරණය කරන්නා වූ ද;

හෝ

(ආ) නියමිත දිනයෙන් පසුව නිලධාරිනියක වන්නා වූ ද

තැනැත්තියක අදහස් වේ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ සාමාන්‍ය අදහස් වේ;

“නිලධාරිනිය” යන්නෙන්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට අයිතිවාසිකම ඇති කරන සහ ශ්‍රී ලංකාවේ රජයේ සේවයේ ස්ථිර ධුරයක් දරන ස්ත්‍රියක අදහස් වේ;

“වැටුප” යන්නෙන්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ යම් නිලධාරිනියකට විශ්‍රාම වැටුප් ලැබීමට අයිතිවාසිකම ඇති කරන සහ නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවයේ දරනු ලබන යම් ස්ථිර ධුරයක් සම්බන්ධයෙන් ඇයට ගෙවනු ලබන පාරිශ්‍රමිකය අදහස් වන අතර, ඒ ධුරය සම්බන්ධයෙන් ගෙවනු ලබන, විශ්‍රාම වැටුප් ලැබිය යුතු යම් දීමනා ද ඊට ඇතුළත් වේ. එහෙත්, ඒ නිලධාරිනියට ගෙවනු ලබන ගාස්තු කිසිවක් ඊට ඇතුළත් නොවේ;

“ආපසු ගෙවිය යුතු දායක මුදල්” යන්න විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් නොමැති වැන්දඹුවක සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් ඇගේ ස්වාමි පුරුෂයා මිය ගිය දිනය හෝ ඇගේ දරුවාට හෝ ඇගේ දරුවන් අතුරෙන් බාලම දරුවාට හෝ විශ්‍රාම වැටුප් ලැබීම නතර වූ දිනය යන දින දෙකෙන් පසුව උදාවන දින සිට මේ පනත යටතේ ඇය විසින් ගෙවන ලද දායක මුදල් අදහස් වේ.